# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2461/44 - 2025 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා - 2025.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙම *ගැසට් නිවේදනය* මඟින් 2023 දෙසැම්බර් 31 දිනැති අංක 2364/37 දරන *අතිවිශෙෂ ගැසට් නිවේදනය* මඟින් අවසන් වරට සංශෝධනය කරන ලද 2022 දෙසැම්බර් 31 දිනැති අංක 2312/67 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* සඳහන් නියෝගයේ IV වන උපලේඛනය, එහි II තීරුවේ නිශ්චිතව දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 7103.10 ට අනුරූපව එහි III තීරුවේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සහ IV තීරුවේ ඇති අනුරූපී ඇතුළත් කිරීම, ඉවත් කිරීම සහ මෙම උපලේඛනයෙහි IV වන තීරුවේ නිදහස් ලෙස දක්වා ඇති I හා II වන තීරුවල නිශ්චිතව සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ සහ සංයෝජිත වර්ගීකරණ සංකේතවලට අනුරූපව එහි III වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ, ඇතුළත් කිරීම මඟින්, සංශෝධනය කරමි.

මෙම නියෝගය 2025 නොවැම්බර් 08 දින සිට බලපැවැත්වේ.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 නොවැම්බර් මස 07 වැනි දින,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.
කොළඹ 01 දී ය.

1A - PG 7357 — 403 (2025/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංකය (I) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (II) | විස්තරය (III) | සහනදායී අනුපාතය (IV) |
|---|---|---|---|
| **71.03** | | **වැඩ දැමූ හෝ නොදැමූ, වර්ග කළා වූ හෝ නොකළා වූ, නමුත් අමුණා නැති සවි නොකළා වූ හෝ නොබැඳි අනගි මැණික් ගල් (දියමන්ති හැර) සහ අර්ධ අනගි මැණික් ප්‍රවාහනය කිරීමේ පහසුව සඳහා තාවකාලිකව සවිකළා වූ, වර්ග නොකළ, අනගි මැණික් ගල් (දියමන්ති හැර) සහ අර්ධ අනගි මැණික් වර්ග.** | |
| | 7103.10.10 | අනගි මැණික් ගල් | නිදහස් |
| | 7103.10.20 | අර්ධ අනගි මැණික් ගල් | නිදහස් |

EOG 11 - 0147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.